විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක: 07/2022
ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................
දිනය / திகதி / Date } 2022.12.08

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික - 2023**

ශ්‍රී ලාංකික විශ්‍රාමික ප්‍රජාවගේ විශ්‍රාම වැටුප් ලබාදීම අඛණ්ඩව සිදු කිරීම සඳහා වාර්ෂිකව ඔවුන්ගේ ජීවිත සහතික ලබාගැනීම සිදුකෙරේ. 2023 වර්ෂය සඳහා ද ජීවිත සහතික ලබාගැනීමට අවශ්‍යව පවතින අතර රටේ පවත්නා ආර්ථික හා සාමාජීය තත්ත්වයන් සලකා වියදම කළමනාකරණය කිරීම අරමුණ කරගනිමින් එක් එක් විශ්‍රාමිකයාට එක් ආකෘති පත්‍රයක් වෙනුවට, ග්‍රාම නිලධාරි වසම් මට්ටමෙන් එක් ආකෘති පත්‍රයක් පමණක් වන සේ ක්‍රමවේදය වෙනස් කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ (ඇමුණුම 01).

02. ඒ අනුව මේ සමග අමුණා ඇති ආකෘතිය හඳුන්වාදෙන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්නා දත්ත පදනම් කර ගනිමින් එහි 01, 02, 03, 04 යන කොටස් ග්‍රාම නිලධාරි වසම් මට්ටමෙන් පූරවා ග්‍රාම නිලධාරීන් වෙත නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. එම ආකෘතිය අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතිය හරහා ලබා ගන්නා ආකාරය පිළිබඳ උපදෙස් 2022.12.12 දින ඔබ වෙත නිකුත් කරනු ඇත. ග්‍රාම නිලධාරි වසමේ පදිංචිව සිටින විශ්‍රාමිකයින් ග්‍රාම නිලධාරි කාර්යාලය වෙත පැමිණ තම හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කිරීමෙන් අනතුරුව එම ආකෘතියෙහි විශ්‍රාමිකයාට අදාළ ස්ථානයෙහි අත්සන් කිරීමට /අත්සන් කළ නොහැකි අයෙකු නම් පමණක් ඇඟිලි සලකුණ තැබීමට අවස්ථාව ලබාදීම තුළින් ජීවිත සහතිකය සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.

03. ඇමුණුම 01 ආකෘතියෙහි වෙනත් කරුණු යටතේ

I. අත්සන වෙනුවට ඇඟිලි සලකුණ තැබුවේ නම් ඊට හේතුව

II. වැන්දඹුව හෝ වැන්දඹු පුරුෂයා නැවත විවාහ වී ඇත්නම් ඒ බව

III. අනත්දරුවා රැකියාවක නිරත වී ඇත්නම් ඒ බව

IV. විශ්‍රාමිකයා පදිංචිය හැර ගොස් ඇත්නම් වර්තමාන පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා ග්‍රාම නිලධාරි වසම

V. විශ්‍රාමිකයා වෙනුවෙන් භාරකරුවෙකු පත් කර ඇත්නම් භාරකරුවාගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය

VI. විශ්‍රාමිකයා විදේශගත වී ඇත්නම් ඒ බව

VII. ඔබ විසින් නිරීක්ෂණය කරන ලද වෙනත් විශේෂ කරුණු සටහන් කළ යුතුය.

**04. ඇඟිලි සලකුණ මගින් ජීවිත සහතිකය තහවුරු කිරීමේ පහසුකම ප්‍රදේශීය ලේකම් කාර්යාල 26ක් හා රාජ්‍ය හා පෞද්ගලික බැංකු 6ක ශාඛා 476ක් හරහා ක්‍රියාත්මක වේ. එමගින් සලසා ඇති ඇඟිලි සලකුණ තහවුරු කිරීමේ පහසුකම උපයෝගී කර ගනිමින් තම ජීවිත සහතිකය ලබාදීමට හැකියාව ඇති විශ්‍රාමිකයන් වෙත ඒ බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් කෙටි පණිවිඩයක් (SMS) මගින් දැනුම්දීමක් සිදු කරනු ඇත. එම විශ්‍රාමිකයන්ගේ තොරතුරු ඇමුණුම 01 ආකෘතියට ඇතුළත් නොකළ යුතුය.**

05. ජීවිත සහතික ලබා ගැනීමේ දී පූජ්‍ය පක්ෂය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය දැක්වෙන අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF-2/15 CORDI/1507-(SUB 1) හා 2019.11.06 දිනැති ලිපියේ සඳහන් පරිදි ග්‍රාම නිලධාරී විසින් භික්ෂූන් වහන්සේ හෝ සිල් මාතාව වැඩ වසන විහාරය/ආරාමය/ආරණ්‍යය වෙත ගොස් ජීවිත සහතිකය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

06. ආබාධිත හෝ වයස්ගතභාවය හේතුවෙන් නිවසෙහිම වෙසෙන/ වැඩිහිටි නිවාසවල වෙසෙන විශ්‍රාමිකයන්ගේ හා අනත්දරුවන්ගේ ජීවිත සහතිකය එම නිවසට ගොස් පරීක්ෂා කර තහවුරු කළ යුතුය. විශ්‍රාමිකයා වෙනුවෙන් භාරකරුවෙකු පත්කර තිබුණ ද විශ්‍රාමිකයා විසින්ම ඇමුණුම 01 ආකෘතියෙහි අත්සන් කිරීම / අත්සන් කළ නොහැකි අයෙකු නම් පමණක් ඇඟිලි සලකුණ තැබීම සිදුකළ යුතුය.

07. ජීවිත සහතික දත්ත පද්ධතිය 2023.03.31 දිනට පෙර යාවත්කාලීන කළ යුතු බැවින් එය ගැටළුවකින් තොරව සිදු කිරීම සඳහා පහත පරිදි කටයුතු කළ යුතුය.

i. අත්සන් කරන ලද ආකෘතිය ග්‍රාම නිලධාරී විසින් 2023.02.15 දිනට ප්‍රාදේශීය ලේකම් වෙත භාරදිය යුතුය. එම තොරතුරු මත විශ්‍රාම වැටුප් විෂයභාර නිලධාරීන් විසින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමෙන් අනතුරුව එතෙක් ජීවිත සහතිකය තහවුරු කිරීම සඳහා අත්සන් නොකළ විශ්‍රාමිකයන්ගේ ලේඛනය 2023.02.20 දින නැවත අදාළ ග්‍රාම නිලධාරී වෙත ලබාදිය යුතුය. ග්‍රාම නිලධාරී විසින් එම ලේඛනය සම්පූර්ණ කර 2023.03.31 දිනට ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී අවසන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ii. ඉහත සෑම අවස්ථාවකදී ම ග්‍රාම නිලධාරී වෙත ඉදිරිපත්ව අත්සන් කිරීමට අපොහොසත් වූ විශ්‍රාමිකයන්ගේ අත්සන තීරුව නැවත අත්සන් කළ නොහැකි සේ කපා හැරීමට වගබලාගත යුතුය.

08. ජීවිත සහතිකය 2023.03.31 දිනට යාවත්කාලීන නොකරන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් අත්හිටුවන බව විශ්‍රාමිකයන්ට දැනුම් දිය යුතුය.

09. ඇඟිලි සලකුණ මගින් ජීවිත සහතිකය යාවත්කාලීන කිරීමට ලියාපදිංචි වී ඇති ද යන්න විශ්‍රාමිකයාට ද පහත පරිදි දැනගත හැකිය.
www.pensions.gov.lk → Public Services → Digital Life Certificate Information

10. ඇඟිලි සලකුණු මගින් ජීවිත සහතිකය තහවුරු කළ හැකි බැංකු ශාඛා 476 හි නාම ලේඛනය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26ක නාම ලේඛනය භාෂාත්‍රයෙන් පහත පරිදි බාගත කරගත හැකිය.

www.pensions.gov.lk → Resources → Downloads → Life Certificate -2023 through Finger Prints from 01.01.2023

11. ඇඟිලි සලකුණු මගින් ජීවිත සහතිකය තහවුරු කිරීම සඳහා පහසුකම් ලබා දී ඇති ප්‍රදේශීය ලේකම් කාර්යාලයන් 26 හි විශ්‍රාම වැටුප් විෂයභාර නිලධාරීන් විසින් ජීවිත සහතිකය ලබා දීමට පැමිණෙන විශ්‍රාමිකයින් වෙත එම පහසුකම් සැලසීම සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

12. විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික - 2023 ග්‍රාම නිලධාරීන්ට උපදෙස් ලබා දීම මැයෙන් යුතුව අංක HA/3/3/10-2 හා 2022.12.08 දිනැතිව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් උපදෙස් මාලාව නිකුත් කර ඇති බව ද කාරුණිකව දන්වමි.

13. වර්තමානයේ රටේ පවත්නා තත්ත්වය සැලකිල්ලට ගනිමින් වියදම් කළමනාකරණය උදෙසා මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට ඔබෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.

**ඒ.ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

| | | |
|---|---|---|
| 01. | ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස |
| 02. | සභාපති, රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල | - විශ්‍රාමිකයින්ගේ සංගම් මගින් විශ්‍රාමිකයන් දැනුවත් කිරීම සඳහා |

Annex 01

**Form Issued with Pension Instruction Letter No. 07/2022**
**Pensioners' Life Certificate – 2023**

| District | | Divisional Secretariat | | Grama Niladhari Division/No | |
|---|---|---|---|---|---|

| 01. Name of the Pensioner | 02. Pension Number (Type/Number) | 03. NIC Number | 04. Contact Number | 05. Signature | 06. Remarks |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |
| 6. | | | | | |
| 7. | | | | | |
| 8. | | | | | |
| 9. | | | | | |
| 10. | | | | | |
| 11. | | | | | |
| 12. | | | | | |
| 13. | | | | | |
| 14. | | | | | |
| 15. | | | | | |

I certify that the signatures of the above pensioners are affixed in my presence.

..................
Date

....................................
Signature of Grama Niladahri and Official Stamp